# ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාව

## ශිල්පීය අංශ වෙත ඉඳුරාම නාවිකයින් බඳවාගැනීම සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශය වෙත ඉඳුරාම නාවික ශිල්පීන් හා ශිල්පිනියන් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි හා කාන්තා අපේක්ෂකයන්ගේ ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන් ම සපුරාලිය යුතුය.

| | | |
|---|---|---|
| අ. | පුරවැසිභාවය | - ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| ආ. | වයස | - 2024 ජූලි මස 07 වැනි දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 33 ට නොවැඩි විය යුතුයි. |
| ඇ. | උස | - (පිරිමි) අඩි 5 අඟල් 5 ට (කාන්තා) අඩි 5 අඟල් 3 ට නොඅඩු විය යුතුයි. |
| ඈ. | බර | - (පිරිමි) කි.ග්‍රෑ. 47 (රාත්තල් 105) ට (කාන්තා) කි.ග්‍රෑ. 36 (රාත්තල් 80) ට නොඅඩු විය යුතුයි. |
| ඉ. | පපුව | - අඟල් 32 ට නොඅඩු විය යුතුයි. (පිරිමි) |
| ඊ. | වර්ණ දෘෂ්ඨිය | - එස්ටීඩී II |
| උ. | දෘෂ්ඨි තීක්ෂණත්වය | - වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහ කාච රහිතව) |
| ඌ. | සිවිල් තත්වය | - අයදුම්කරුවන්ට විවාහක/ අවිවාහක දෙපාර්ශවයෙන් ම අයදුම් කළ හැක. |

3. බඳවාගනු ලබන අංශයන්:

| | | |
|---|---|---|
| අ. | එන්ජින් කාමර ශිල්පී | |
| ආ. | මෝටර් රථ ශිල්පී | |
| ඇ. | විදුලි ශිල්පී | - (විදුලි බල උත්පාදන, බෙදාහැරීම සහ පාලනය සහ ස්වයංක්‍රීයකරණය) |
| ඈ. | ගුවන් විදුලි ශිල්පී | - (විද්‍යුත් හා දුරකථන / දත්ත සන්නිවේදන ක්ෂේත්‍රය සඳහා) |

4. අධ්‍යාපන සුදුසුකම් :

අ. අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය, මව්බස, විද්‍යාව විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුය.

ආ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් (එක් වරක දී)

| | | | |
|---|---|---|---|
| (1) | ගණිත විෂය ධාරාව - | සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබිය යුතුය | එන්ජින් කාමර ශිල්පී<br>මෝටර් රථ ශිල්පී |
| (2) | තාක්‍ෂණ විෂය ධාරාව - | තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ ඉංජිනේරු තාක්ෂණවේදය සඳහා සාමාන්‍ය සාමාර්ථ තිබිය යුතුය. | එන්ජින් කාමර ශිල්පී<br>මෝටර් රථ ශිල්පී |
| (3) | ගණිත විෂයය ධාරාව හෝ ජීව විද්‍යාව විෂයය ධාරාව හෝ තාක්ෂණික විෂය ධාරාව - | සාමාන්‍ය සාමාර්ථ දෙකක් තිබිය යුතුය | විදුලි ශිල්පී<br>ගුවන් විදුලි ශිල්පී |

5. වෘත්තීය සුදුසුකම් :

අ. එන්ජින් කාමර ශිල්පී (III පන්තිය)

(1) NVQ V/ VI මට්ටමේ නාවික හෝ යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම;

විශේෂ සුදුසුකම් :

(අ) නාවික කටයුතු පිළිබඳ ඉංජිනේරු අංශයේ තාක්ෂණික විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDT) සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(ආ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් උසස් ජාතික ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(ඇ) නාවික ඉංජිනේරු අංශයෙන් ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDES) සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(ඈ) යාන්ත්‍රික අංශයෙන් තාක්ෂණ හා අධ්‍යාපනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(ඉ) තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලද ආයතනයකින් හෝ ඊට සමාන වූ සුදුසුකම් ලබා දීමේ හැකියාවක් ඇති ආයතනයකින් (රජයේ හෝ පෞද්ගලික) NVQ V/VI මට්ටමේ නාවික හෝ යාන්ත්‍රික ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

(2) රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක් හෝ ඊට වැඩි කාලයක පළපුරුද්දක් ලබා තිබීම.

ආ. **එන්ජින් කාමර ශිල්පී** (IV **පන්තිය**)

(1) NVQ V/ VI මට්ටමේ නාවික හෝ යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම

විශේෂ සුදුසුකම් :

(අ) නාවික කටයුතු පිළිබඳ ඉංජිනේරු අංශයේ තාක්ෂණික විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDT) සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(ආ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයෙන් උසස් ජාතික ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(ඇ) නාවික ඉංජිනේරු අංශයෙන් ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDES) සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(ඈ) යාන්ත්‍රික අංශයේ තාක්ෂණ හා අධ්‍යාපනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම.

හෝ

(ඉ) තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලද ආයතනයකින් හෝ ඊට සමාන වූ සුදුසුකම් ලබා දීමේ හැකියාවක් ඇති ආයතනයකින් (රජයේ හෝ පෞද්ගලික) NVQ V/VI මට්ටමේ නාවික හෝ යාන්ත්‍රික ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

(2) රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක් හෝ ඊට වැඩි කාලයක පළපුරුද්දක් ලබා තිබීම.

ඇ. මෝටර් රථ ශිල්පී (III පන්තිය)

(1) NVQ V/VI මට්ටමේ ස්වයංචලන ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම

විශේෂ සුදුසුකම් -

(අ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ තාක්ෂණික විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDT) සාර්ථකව නිම කර තිබීම.

*හෝ*

(ආ) කාර්මික පුහුණු ආයතනයක් (TTI) මඟින් ස්වයංචලන ඉංජිනේරු අංශයේ ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම.

*හෝ*

(ඇ) කුලියාපිටිය විශ්ව විද්‍යාලය මඟින් ස්වයංචලන තාක්‍ෂණික ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම.

*හෝ*

(ඈ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය මඟින් ස්වයංචලන ඉංජිනේරු ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම.

*හෝ*

(ඉ) ඔරුගොඩවත්ත ස්වයංචලන ඉංජිනේරු පුහුණු ආයතනය මඟින් ස්වයංචලන ඉංජිනේරු පාඨමාලාව සාර්ථකව නිම කර තිබීම.

*හෝ*

(ඊ) තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලද ආයතනයකින් හෝ ඊට සමාන වූ සුදුසුකම් ලබා දීමේ හැකියාවක් ඇති ආයතනයකින් (රජයේ හෝ පෞද්ගලික) NVQ V/ VI මට්ටමේ ස්වයංචලන ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

(2) රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක් හෝ ඊට වැඩි කාලයක පළපුරුද්දක් ලබා තිබීම.

ඈ. මෝටර් රථ ශිල්පී (IV පන්තිය)

(1) NVQ V/ VI මට්ටමේ ස්වයංචලන ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

විශේෂ සුදුසුකම් :

(අ) යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ තාක්ෂණික විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDT) සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(ආ) කාර්මික පුහුණු ආයතනයක් (TTI) මඟින් ස්වයංචලන ඉංජිනේරු අංශයේ ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(ඇ) කුලියාපිටිය විශ්වවිද්‍යාලය මඟින් ස්වයංචලන තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(ඈ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය මඟින් ස්වයංචලන ඉංජිනේරු ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර තිබීම.

*හෝ*

(ඉ) ඔරුගොඩවත්ත ස්වයංචලන ඉංජිනේරු පුහුණු ආයතනය මඟින් ස්වයංචලන ඉංජිනේරු පාඨමාලාව සාර්ථකව නිම කර තිබීම.

හෝ

(ඊ) තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලද ආයතනයකින් හෝ ඊට සමාන වූ සුදුසුකම් ලබා දීමේ හැකියාවක් ඇති ආයතනයකින් (රජයේ හෝ පෞද්ගලික) NVQ V/VI මට්ටමේ ස්වයංචලන ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

(2) රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක් හෝ ඊට වැඩි කාලයක පළපුරුද්දක් ලබා තිබීම.

ඉ. *විදුලි ශිල්පී (IV පන්තිය)* :

(1) NVQ V මට්ටමේ විදුලි ඉංජිනේරු/ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු/ කාර්මික ස්වයංක්‍රීයකරණය/ යාන්ත්‍රික ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම.

*විශේෂ සුදුසුකම් :*

(*අ*) තාක්ෂණික විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDT) සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(*ආ*) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE) සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(*ඇ*) ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDES) සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(*ඈ*) තාක්ෂණ හා අධ්‍යාපන පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම;

(*ඉ*) තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලද ආයතනයකින් හෝ ඊට සමාන වූ සුදුසුකම් ලබා දීමේ හැකියාවක් ඇති ආයතනයකින් (රජයේ හෝ පෞද්ගලික) NVQ V/VI මට්ටමේ විදුලි ඉංජිනේරු/ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු/ කාර්මික ස්වයංක්‍රියකරණය/ යාන්ත්‍රික ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම.

(2) රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක් හෝ ඊට වැඩි කාලයක පළපුරුද්දක් ලබා තිබීම.

ඊ. ගුවන් විදුලි ශිල්පී (IV පන්තිය) :

(1) NVQ V මට්ටමේ විද්‍යුත් ඉංජිනේරු/ විදුලි සංදේශන ඉංජිනේරු/ ජාලකරණ යන අංශයකින් ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සාර්ථකව නිම කර තිබීම.

*විශේෂ සුදුසුකම් :*

(*අ*) තාක්ෂණික විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDT) සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(*ආ*) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE) සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(*ඇ*) ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDES) සාර්ථකව නිම කර තිබීම;

*හෝ*

(*ඈ*) තාක්ෂණ හා අධ්‍යාපන පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සාර්ථකව නිම කර තිබීම.

(*ඉ*) තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කරන ලද ආයතනයකින් හෝ ඊට සමාන වූ සුදුසුකම් ලබා දීමේ හැකියාවක් ඇති ආයතනයකින් (රජයේ හෝ පෞද්ගලික) NVQ V/ VI මට්ටමේ විද්‍යුත් ඉංජිනේරු/ විදුලි සංදේශන ඉංජිනේරු/ ජාලකරණ යන ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

(2) රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක් හෝ ඊට වැඩි කාලයක පළපුරුද්දක් ලබා තිබීම.

6. ඉහත 2 සහ 4 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

7. *සේවා කොන්දේසි :*

*අ.* අපේක්ෂකයින් ශිල්පීය අංශයේ III සහ IV වන පන්තියේ නාවිකයින් වශයෙන් බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ.

*ආ.* පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන් පසුව, බඳවාගත් නාවිකයන් නාවික හමුදා නීතියට යටත් විය යුතුයි.

*ඇ.* සෑම බඳවාගත් නාවිකයෙකුටම සියලු ආයිත්තම් සහිත නිල ඇඳුම් සහ උපකරණ සපයනු ලැබේ.

*ඈ.* පුහුණුව ලබන කාලසීමාව තුළ, බඳවාගත් නාවිකයින් හට නවාතැන් පහසුකම් හා ආහාර නාවික හමුදාව මගින් සපයනු ලැබේ

*ඉ.* පුහුණුවන කාලසීමාව තුළ දී, යම් නාවිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම නාවිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නාවිකයා විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

*ඊ.* පුහුණුව ලබන කාල සීමාව තුළ ඕනෑම අවස්ථාවක දී, යම්කිසි නාවිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ ඇය නාවික හමුදාවේ සේවය සඳහා යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ නාවිකයා විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුයි.

*උ.* සියලු නාවිකයින් රාජකාරී හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට හෝ විදේශ රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

8. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා : තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

9. *වැටුප් හා දීමනා :*
2020.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ. ඒ අනුව,

| | | |
|---|---|---|
| *අ.* | මූලික වැටුප | - රු. 33,490.00 |
| *ආ.* | ජීවන වියදම් දීමනාව | - රු. 17,800.00 |
| *ඇ.* | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | - රු. 350.00 |
| *ඈ.* | දුෂ්කර දීමනාව (මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| *ඉ.* | දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| *ඊ.* | අනෙකුත් දීමනා | - විශේෂ දීමනාව රු. 1,000.00 |
| | | - විශේෂ අමතර දීමනාව රු. 2,400.00 |
| *උ.* | අතුරු දීමනාව | - රු. 5,000.00 |
| | සම්පූර්ණ වැටුප අවම වශයෙන් (අවිවාහක) | - රු. 60,040.00 |
| | (විවාහක පිටතවාසී) | - රු. 91,465.00 |

*ඌ.* නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නාවිකයාට, කලත්‍රයාට,ළමයින්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

*එ.* කඳවුර තුළ වාසය කරන නාවිකයින්ට මසකට වරක් නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

*ඒ.* නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ (අදාළ පරිදි නාවිකයාට, කලත්‍රයාට, ළමයින්ට සහ යැපෙන්නන්ට).

*ඔ.* රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නාවිකයින්ට රු.2,400.00 සිට රු.6,600.00 දක්වා ගෙවල් කුලී දීමනාවන් හිමි වේ.

ඕ. විවාහක නාවිකයින් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

10. *අයදුම්කරුවන්ට උපදෙස් :*

අ. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලු ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් **2024 ජූලි මස 07** වැනි දින **1200** පැයට ප්‍රථම ලැබෙන සේ "ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (බඳවා ගැනීම්) , නාවික හමුදා මූලස්ථානය, තැපෙ 593, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ "ඉඳුරාම නාවික ශිල්පීන් බඳවා ගැනීම"යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකතන අංක 011-7195162, 011-7195155 මඟින් ලබා ගත හැක.

ආ. රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන් හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

ඇ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය;
(2) අයදුම් කර ඇති අංශයන්ට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික;
(3) පාසල් හැරයාමේ සහතිකය;
(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකය;
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/ කාර්මික පුහුණුව සහ පළපුරුද්ද පිළිබඳ සහතික;
(6) මෑතකදී ලබා ගත් චරිත සහතික තුනක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන් විය යුතු අතර, අනෙකුත් සහතික අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ වත්මන් සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී සිටී නම්) විය යුතුය.
(7) ක්‍රීඩා හා වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

ඈ. නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතුය.

ඊ. අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

11. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබීම, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමටද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ ඇය සේවයෙන් පහ කිරීමටද යටත් වේ.

12. *තෝරා ගැනීමේ/ සම්මුඛ පරීක්ෂණ ආදිය :*

අ. ඉහත අවශ්‍යතාවන් සපුරාලන අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. එම පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන අපේක්ෂකයින්ට තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදු වේ.

*ආ.* ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා :

| *ව්‍යායාමය* | *කාලය (මිනිත්තු/තත්පර)* | *පිරිමි* | *කාන්තා* |
|---|---|---|---|
| මීටර් 1600 දිවීම | | මිනිත්තු 09 | මිනිත්තු 11 |
| Push Up | මිනිත්තු 01 | වාර 12ක් හෝ ඊට වැඩි | වාර 08ක් හෝ ඊට වැඩි |
| Sit Up | මිනිත්තු 01 | වාර 10ක් හෝ ඊට වැඩි | වාර 07ක් හෝ ඊට වැඩි |

ඇ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ජංගම දුරකතන අංකයට අදාළව වට්ස්ඇප් (whatsapp) පණිවුඩ හෝ විද්‍යුත් තැපැල මගින් පමණක් දැනුම් දෙනු ලබන අතර, තැපැල් මගින් හෝ වෙනත් කිසිදු ආකාරයකින් සිදු නොකෙරේ. තවද සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

ඈ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

ඉ. අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

ඊ. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දී මෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙකු වීමට හේතු වන්නේය.

උ. බඳවාගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

**සටහන** - මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ම පළවන අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

යූවීඑම්පී පෙරේරා, ආර්එස්පී**, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ 01.